# MyReport *Plus*
# පරිශීලක අත්පොත

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය
இலங்கை கொடுகடன் தகவல் பணியகம்
CREDIT INFORMATION BUREAU OF SRI LANKA
Tel: 011 2131313, Fax: 011 2338259
E mail: info@crib.lk, Web site: www.crib.lk

මෙම ප්‍රකාශනයෙහි ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයට අදාල රහස්‍ය හෝ බුද්ධිමය දේපල ගණයට අයත් හෝ නීතියෙන් ආරක්ෂිත තොරතුරු අන්තර්ගත විය හැක. මෙහි අඩංගු තොරතුරු හෝ තොරතුරක් සාවද්‍ය ලෙස අර්ථකථනය කිරීම හෝ වටහාගැනීම හෝ භාවිතය හේතුවෙන් ඇති විය හැකි යම් හානි හෝ අලාභයන් සඳහා කාර්යාංශය කිසිසේත්ම වගකියනු නොලැබේ. අවශ්‍ය හා අදාල සෑම අවස්ථාවන්හිදීම මෙහි අඩංගු තොරතුරු පිළිබඳ වැඩිදුර විමසීම හෝ තහවුරු කරගැනීම සඳහා කාර්යාංශයේ සහය හෝ උපදෙස් පතන ලෙස ඔබට අවධාරණය කර සිටිමු. මෙහි අඩංගු කිසිදු තොරතුරක් හෝ ඉන් කොටසක් කාර්යාංශයේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව කිසිදු අයුරකින් හෙලිකිරීම හෝ පිටපත් කිරීම හෝ නැවත මුද්‍රණය කිරීම හෝ බෙදා හැරීම සපුරා තහනම් වේ. මෙම ප්‍රකාශනයෙහි දැක්වෙන සියළුම තිර සටහන්වල උපුටාගැනීම්, පරිශීලනය කරනු ලබන ණය තොරතුරු වාර්තාවෙහි දැක්වෙන තොරතුරු සමග වෙනස්විය හැකි බවත් එම තිර සටහන් හුදෙක් නිදර්ශනය කිරීම සඳහා යොදා ඇති බවත් දන්වා සිටින අතර, ණය තොරතුරු කළමනාකරණ පද්ධතිය (CIMS) තුළ පවතින කිසිදු පුද්ගලයෙකුගේ හෝ ආයතනයක කිසිදු තොරතුරක් මෙමගින් ප්‍රදර්ශනය හෝ නියෝජනය නොකරන බවත් අවධාරණය කර සිටිමු.

**සියළු හිමිකම් ඇවිරිණි**

**ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය 2022.**

| පිටපත | දිනය | සටහන |
|---|---|---|
| 1.0 | 2022 දෙසැම්බර් මස 30 | iReport & iReport Plus පරිශීලක අත්පොත මගින් ස්වකීය ණය තොරතුරු වාර්තාවේ (පුද්ගල හා ව්‍යාපාරික) සියළුම කොටස් සවිස්තරාත්මකව සඳහන් කිරීම. |
| 2.0 | 2024 මාර්තු මස 01 | “iReport” නාමය “MyReport” ලෙස යාවත්කාලීන කිරීම.<br>ණය ලකුණු (Credit Score) සහිත, ස්වකීය ණය තොරතුරු වාර්තාව පමණක් පරිශීලනය කිරීම සඳහා යාවත්කාලීන කිරීම. |

## ස්වකීය ණය තොරතුරු වාර්තාව නිවැරදිව හඳුනා ගනිමු.

ස්වකීය ණය තොරතුරු වාර්තාව ලෙස, පුද්ගල හෝ ආයතනික වශයෙන් පොදුවේ භාවිතා කළ හැකි පහත සඳහන් වාර්තා වර්ගය පිළිබඳව මෙම පරිශීලක අත්පොත මගින් විස්තර කෙරේ.

- **MyReport Plus** - ණය ලකුණ (Credit Score) සහිත, ස්වකීය ණය තොරතුරු වාර්තාව.

සැ. යු.: ණය ලකුණ සහිත, ස්වකීය ණය තොරතුරු වාර්තාවෙහි (**MyReport Plus**) අන්තර්ගතයන් මෙම පරිශීලක අත්පොත මගින් විස්තර කෙරේ.

## ස්වකීය ණය තොරතුරු වාර්තාව (MyReport Plus) යනු කුමක්ද ?

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ කොටස් හිමිකාරත්වය ඇති සාමාජික ණය දෙන ආයතන (බලපත්‍රලාභී ණය දෙන ආයතන - වාණිජ බැංකු, විශේෂිත බැංකු, කල්බදු සහ මූල්‍ය සමාගම්) තම ණයකරුවන්ගේ සෑම ණය පහසුකමකටම අදාල තොරතුරු පූර්ණ වශයෙන් කාර්යාංශයට වාර්තා කිරීමට, 1995 අංක 08 දරන පනතින් සහ 2008 අංක 42 දරන පනතින් සංශෝධිත, 1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශ පනතේ නියමයන්ට අනුකූලව නීතියෙන් බැඳී සිටී. දැනට පවත්නා සහ අළුතින් ප්‍රදානය කරන ලද ණය පහසුකම්වල සියළුම තොරතුරු සෑම මසක් අවසානයේම කාර්යාංශයට වාර්තා කිරීම සහ යාවත්කාලීන (update) කිරීම සිදුකළ යුතුය.

කාර්යාංශය සතුව පවතින ණය තොරතුරු **පුද්ගල** සහ **ආයතනික** ලෙස වර්ග කෙරේ. පුද්ගලයෙකුගේ ණය තොරතුරු ජාතික හැඳුනුම්පත් අංකය යටතේ ද (ශ්‍රී ලාංකිකයකු නම්) / ගමන් බලපත්‍ර අංකය යටතේ ද (ශ්‍රී ලාංකිකයකු නොවේ නම්) ගොණු ගත කෙරෙන අතර ආයතනික ණය තොරතුරු, ව්‍යාපාර ලියාපදිංචි අංකය යටතේ ගොණු ගත කෙරේ. " ණය තොරතුරු වාර්තා" ලෙස මෙම තොරතුරු ආපසු සාමාජික ණය දෙන ආයතන වෙත, ඉල්ලීමක් කළ විටෙක දී හෝ පුද්ගලයෙකු / ආයතනයක් ස්වකීය ණය තොරතුරු වාර්තාව ඉල්ලා සිටින අවස්ථාවක දී, ලබාදීමට කාර්යාංශය බැඳී සිටී.

පුද්ගලයෙකු හෝ ආයතනයක් ස්වකීය ණය තොරතුරු වාර්තාව ඉල්ලා සිටින අවස්ථාවකදී "MyReport Plus" ලෙස සකස් කරන ලද පුද්ගල හෝ ආයතනික ණය තොරතුරු වාර්තාව මෙසේ ඔබට හෝ ඔබගේ ව්‍යාපාර ආයතනයට ලැබෙනුයේ, එම තොරතුරු ලබාගැනීමට ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශ පනත මගින් ඔබ වෙත හෝ ඔබගේ ව්‍යාපාර ආයතනයට ලබාදී ඇති බලතලවලට අනුකූලවයි.

## ස්වකීය ණය තොරතුරු වාර්තාව (MyReport Plus) වැදගත් වන්නේ ඇයි ?

MyReport Plus යනු ඔබ විසින් හෝ ඔබගේ ව්‍යාපාර ආයතනය විසින් විවිධ ණය දෙන ආයතන මගින් ලබාගත් සියළුම ණය සහ එම ණය ආපසු ගෙවීමේ අතීතය පිළිබඳ තොරතුරු ඇතුලත් සංක්ෂිප්ත වාර්තාවකි.

ණය දෙන ආයතන, ඔබට හෝ ඔබගේ ව්‍යාපාර ආයතනයට ණය පහසුකමක් ප්‍රදානය කිරීමට ප්‍රථම ඒ සඳහා වන යෝග්‍යතාවය මෙම වාර්තා ඇසුරින් අධ්‍යයනය කරනු ලැබේ. යහපත් ණය ආපසු ගෙවුම් අතීතයක් පවත්වා ගැනීම නැවත ණය පහසුකමක් ලබාගැනීමේදී පිටුවහලක් වනු ඇත.

ස්වකීය ණය තොරතුරු වාර්තාව ලබාගැනීමෙන් අත්වන ප්‍රතිලාභයන් ;

- ණය පහසුකමක් ඉල්ලුම් කිරීමට පෙර, වාර්තාවේ අන්තර්ගතය ඔබට දැනගැනීමට හැකි වේ.
- ආපසු ගෙවීමේ පුරුදු විධිමත් කිරීමට උපකාරී වේ.
- වැරදි හෝ යාවත්කාලීන නොවූ තොරතුරු ඇත්නම් ඒවා නිවැරදි හෝ යාවත්කාලීන කරගැනීමට හැකි වේ.
- ඇපකරු ලෙස ඇති ණය පහසුකම් නිරීක්ෂණය කිරීමට උපකාරී වේ.
- විනයගරුක ණය කරුවෙකු වීමට උපකාරී වේ.

සය මසකට වරක්වත් ස්වකීය ණය තොරතුරු වාර්තාව ලබාගැනීම තුලින් එහි අන්තර්ගත තොරතුරුවල නිරවද්‍යතාවය සහ යාවත්කාලීන බව ඔබට සනාථ කරගත හැකිවෙනු ඇත.

## ණය යෝග්‍යතාවය (ණය පහසුකමක් ලබාගැනීමට ඇති හැකියාව) වර්ධනය කරගත හැක්කේ කෙසේද?

- සැමවිටම ආදායම් හා වියදම් අතර සමතුලනයක් පවත්වා ගැනීම හා ආපසු ගෙවීමේ හැකියාව මත පමණක් ණය ලබාගැනීම. ණය පහසුකමක් ඉල්ලුම් කිරීමට පෙර, මූලික අවශ්‍යතා සඳහා වන මාසික වියදම් (විදුලිය, ජලය හා දුරකථන ආදී සේවා සඳහා මාසික ගෙවීම්, අනෙකුත් ගෘහ හා පෞද්ගලික අවශ්‍යතා සඳහා අනිවාර්යය වියදම්) පිළිබඳව වැඩි සැලකිල්ලක් දැක්වීම.

- ණය හා මූල්‍ය පහසුකම් ලබාගැනීමට ප්‍රථම, ඒ හා සම්බන්ධ ගිවිසුම්වල අන්තර්ගත කොන්දේසි - වගකීම් පිළිබඳව මනා අවබෝධයක් ලබාගැනීම. (Terms & Conditions of Loan Agreements)

- ණය වාරික ආපසු ගෙවීම ගිවිසගත් ආකාරයටම සිදුකිරීම අත්‍යාවශ්‍යය වන අතර හැකියාවක් ඇතිවිට කඩිනමින් ගෙවා අවසන් කිරීම යෝග්‍යවේ. විශේෂයෙන්ම ක්‍රෙඩිට් කාඩ්පත් ශේෂයන් පූර්ණ වශයෙන් ගෙවා නිමකිරීම ඔබගේ ණය යෝග්‍යතාවය යහපත් තත්වයකට ගෙන ඒමට හොඳ පිටිවහලක් වනු ඇත.

- ණය පහසුකමක් සඳහා ඔබ ඇපකරුවෙකු ලෙස ඉදිරිපත් වන අවස්ථාවන්හිදී, ණය ගැණුම්කරුගේ ණය ගෙවීමේ හැකියාව පිළිබඳව මනා අවබෝධයක් තිබිය යුතු වේ. මක්නිසාද යත් ණය ගැණුම්කරු, ඔහු හෝ ඇය ලබාගත් ණය ගෙවීමට අසමත් වුවහොත්, ඇපකරුට ණය ගෙවීමට සිදුවන බැවිනි.

## ස්වකීය ණය තොරතුරු වාර්තාවෙහි (MyReport Plus) අන්තර්ගත තොරතුරු

**Report Header** - ණය තොරතුරු වාර්තාවේ ශීර්ෂය පහත සඳහන් තොරතුරුවලින් සමන්විත වේ.

**CRIB iReport *plus* - Consumer**

| Reference Number | Requested by | Report Created | Version |
|---|---|---|---|
| 8C09-CA8B-2FE1-4DC6 | 0000990029 | 22-Dec-2022 11:16 | 553 |

Searched Name - **WANNIARACHCHI KANKANAMGE LEELARATNE LIYANAGE**
Searched ID No. - **123456789V**
Searched Address - **25, MAIN STREET, COLOMBO 01**

**Reference Number** - වාර්තාව සඳහා කාර්යාංශය මගින් නිකුත් කරන ලද අංකය.
**Requested by** - වාර්තාව ජනනය කරන ලද පරිශීලක අංකය.
**Report Created** - වාර්තාව නිකුත් කළ දිනය සහ වේලාව.
**Version** - වාර්තාව අයත් අනුවාද අංකය.

**Search Details** - දත්ත පිරික්සුම් තොරතුරු

**Searched Name** - වාර්තාව ඉල්ලුම්කරුගේ නම. (පුද්ගල හෝ ආයතනික නම)
**Searched ID No.** - ජාතික හැඳුනුම්පත් අංකය / ගමන් බලපත්‍ර අංකය / ව්‍යාපාර ලියාපදිංචි අංකය.
**Searched Address** - තැපැල් ලිපිනය අයදුම්පතෙහි සඳහන් කර ඇති.

**සැ. යු.:** ඔබ විසින් MyReport අයදුම් පත්‍රයේ ඉදිරිපත් කර ඇති තොරතුරු වලට අනුව දත්ත පිරික්සුම් තොරතුරු පෙන්වනු ඇත.

**වැදගත් :** ස්වකීය ණය තොරතුරු වාර්තාවෙහි අන්තර්ගතයන්, පුද්ගල හා ආයතනික ණය තොරතුරු වාර්තා දෙකටම පොදු බැවින්, පුද්ගල ණය තොරතුරු වාර්තාවෙහි අන්තර්ගතයන් පමණක් මෙම පරිශීලක අත්පොත මගින් විස්තර කෙරේ.

## උපකාරක පුවරුව (Dashboard Details)

උපකාරක පුවරුව මගින් ස්වකීය ණය තොරතුරු වාර්තාවේ අඩංගු තොරතුරු සාරාංශ ගත කොට ඉදිරිපත් කරයි. එමගින් සියළුම තොරතුරු ඉක්මනින් අධ්‍යනය හා පරිශීලනය කිරීමට හැකියාව ලැබේ. එය පහත සඳහන් කොටස්වලින් සමන්විත වේ.

## Credit Score (ණය ලකුණ)

MyReport Plus හි සඳහන් වන ණය ලකුණ, අංක 03 කින් සමන්විත අගයක් වන අතර එහි අගය 250 සිට 900 දක්වා පරාසයක් ගනු ලැබේ. ණය ලකුණ, ණය අවධානම් කළමනාකරණය සමග බැඳී පවතින අතර ඉහළ ණය ලකුණක් හිමිවීම, ණය දෙන ආයතනවලට අඩු ණය අවධානමක් ලෙස සලකන අතර පහළ ණය ලකුණක් හිමිවීම, ඉහළ ණය අවධානමක් ලෙස සැලකේ.

**Scoring**

| 546 | D1 | ➔ |
|---|---|---|
| Score | Risk Grade | Trend |

**ණය ලකුණ** - දැනට පවතින ණය තොරතුරු පදනම් කරගෙන ගණනය කරන ලද ණය ලකුණ.

**අවධානම් අගය** - වර්ගීකරණය කරන ලද අවධානම් අගය (*වැඩිවිස්තර සඳහා Score Legends බලන්න*).

**ප්‍රවනතාවය** - ණය ලකුණෙහි වෙනස් වීමේ ප්‍රවනතාවය (*වැඩිවීම, අඩුවීම හෝ නොවෙනස්ව පැවතීම*).

## Disputes (දත්ත පිළිබඳ ආරවුල්)

ස්වකීය ණය තොරතුරු වාර්තාවෙහි අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් ඔබ විසින් කාර්යාංශයේ ලියාපදිංචි කරන ලද දත්ත පිළිබඳ ආරවුල් වල සාරාංශය මෙමගින් විස්තර කෙරේ.

**Disputes**

| ⚠ 4 | ⚠ 1 | ✔ 0 |
|---|---|---|
| Active Disputes | False Disputes | Registered in Court |

**සක්‍රියව පවතින ආරවුල්** - නොවිසඳුණු හා දැනට සක්‍රීය තත්වයේ ඇති ආරවුල් සංඛ්‍යාව.

**ප්‍රතික්ෂේපිත ආරවුල්** - කාර්යාංශයට යොමු කරන ලද, නමුත් ණය දෙන ආයතන විසින් අදාල නොවන බව දැන්වූ ප්‍රතික්ෂේපිත ආරවුල් සංඛ්‍යාව.

**උසාවියේ ලියාපදිංචි කර ඇත** - යොමු කරන ලද ආරවුල සම්බන්ධයෙන් අධිකරණමය කටයුත්තක් පවතී.

## Payments Profile Status (ගෙවීම් අතීතය පිළිබඳ තත්වය)


ණයකරු ලෙස සහ බද්ධ ණයකරු ලෙස (ඇපකරු ලෙස සඳහන් කර ඇති ණය පහසුකම් හැර) ලබාගෙන ඇති සියළුම සක්‍රිය සහ ගෙවා නිමි ණය පහසුකම් සියල්ලෙහිම සාරාංශයක් මෙමගින් නිරූපණය කරයි. එක් එක් ණය පහසුකම පිළිබඳ සවිස්තරාත්මක විමර්ශනයකට යාමට පෙර ණයකරුගේ සෘජු බැඳීම් පිළිබඳ මෙමගින් අවබෝධයක් ලබාගත හැක.

**Payment Profile Status**

| | | | |
|---|---|---|---|
| Open Credit Facility | 22 | Closed Credit Facility | 20 |
| ⚠ Total Amount in Arrears | LKR 1,778,492 | Number of Different Creditors | 9 |
| ⊗ Highest Current NDIA | 720 | Total Current Balance | LKR 40,371,045 |
| Total Amount Granted in Open Credit Facilities | LKR 63,356,755 | Total Installment Amount | LKR 8,211,368 |
| ⊗ The Highest NDIA in 12 Months | 720 | | |

## Payments Profile (ගෙවීම් අතීතය)

ස්වකීය ණය තොරතුරු වාර්තාවෙහි සඳහන් සියළුම ණය පහසුකම් වල පසුගිය මාස 24 ක ගෙවුම් අතීතයන් හි සාරාංශයක් මෙමගින් නිරූපණය වේ. සාරාංශ ගත කිරීමේ දී, සියළුම ණය පහසුකම් වල පසුගිය මාස 24 ක ගෙවුම් අතීතයන් හි, **ඉහල හිඟ දින ගණන් ඇති ණය පහසුකම් වල ගෙවුම් අතීතයන්** මෙමගින් ඉස්මතුකර පෙන්වයි.




- හිඟ දින ගණන **0-29** අතර නම් - නිරූපකය (icon) කොළ වර්ණයෙන් සහ "✓" ලකුණෙන් දක්වා ඇත.
- හිඟ දින ගණන **30-89** අතර නම් - නිරූපකය (icon) දුඹුරු වර්ණයෙන් සහ "△" ලකුණෙන් දක්වා ඇත.
- හිඟ දින ගණන **90** කට වැඩි නම් - නිරූපකය (icon) රතු වර්ණයෙන් සහ "⊗" ලකුණෙන් දක්වා ඇත.

## Utilities & Insurances (උපයෝගිතා සේවා සහ රක්ෂණයන්)

දුරකථන බිල්පත්, ජල බිල්පත්, විදුලි බිල්පත් වැනි පසු ගෙවුම් (Post Paid) උපයෝගිතා සේවා සඳහා කරන ලද ගෙවීම් සහ රක්ෂණ වාරික සඳහා කරන ලද ගෙවීම් මෙම කොටසේ සාරාංශයක් ලෙස පෙන්වයි.

**Utilities**

| | | | |
|---|---|---|---|
| Number of Utility Accounts | 0 | Number of Different Providers | 0 |
| Total Current Amount in Arrears | LKR 0 | Highest Current NDIA | 0 |
| The Highest NDIA in 12 Months | 0 | | |

**Insurances**

| | | | |
|---|---|---|---|
| Number of Insurance Policies | 0 | Number of Claims | 0 |
| Total Current Amount in Arrears | LKR 0 | Highest Current NDIA | 0 |
| The Highest NDIA in 12 Months | 0 | | |

## Dishonoured Cheques (අගරු වූ චෙක්පත්)

ජංගම ගිණුමෙහි ප්‍රමාණවත් පරිදි මුදල් නොමැතිවීම මත අගරු කරන ලද චෙක්පත් පිළිබඳ සාරාංශය මෙහිදි නිරූපණය කෙරේ. අගරු වී ඇති සමස්ථ චෙක්පත් සංඛ්‍යාව සහ අගරු වී ඇති චෙක්පත්වල සමස්ථ මූල්‍ය වටිනාකම යනාදී තොරතුරු සාරාංශගතව මෙහි දැක්වේ.


**Dishonoured Cheques**

| Number of Dishonoured Cheques | Weeks Since Last Dishonoured Cheque | Total Dishonoured Cheque Amount |
|---|---|---|
| ⚠ 23 | 59 | LKR 6.66K |

**Relations (ව්‍යාපාරික සබඳතා පිළිබඳ තොරතුරු)**

තනි පුද්ගල හෝ හවුල් ව්‍යාපාර සඳහා පමණක් ඇති ව්‍යාපාරික සබඳතා වාර්තා වී ඇත්නම් එම තොරතුරු මෙහි දැක්වේ.

උදා. හවුල්කරුවෙකුගේ ණය තොරතුරු වාර්තාවෙහි, ඔහු නියෝජනය කරන හවුල් ව්‍යාපාරය "Involved Subject" යටතේ පෙන්නුම් කරන අතර හවුල් ව්‍යාපාරයේ ණය තොරතුරු වාර්තාවෙහි හවුල්කරු "Related Subjects" යටතේ පෙන්නුම් කරයි.




**Inquiries (ණය තොරතුරු සම්බන්ධව කළ විමසීම්)**

ඔබ, ස්වකීය ණය තොරතුරු වාර්තාව පසුගිය සය (06) මසක කාලයක් තුළදී ලබාගෙන ඇති වාර ගණන සහ කොපමණ ණය දෙන ආයතන සංඛ්‍යාවක් පසුගිය සය (06) මසක කාලයක් තුළදී ඔබගේ ණය තොරතුරු වාර්තාව ලබාගත්තේ ද යන්න පිළිබඳ සාරාංශයක් දැක්වේ.




**Collaterals (සුරැකුම් / ඇපකර)**

සුරැකුම් / ඇපකර සහිතව ලබාගෙන ඇති ණය පහසුකම් ගණන මෙමගින් දැක්වේ.




## පුද්ගලමය හෝ ආයතනික තොරතුරු (Subject Information)

මෙම තීරයෙහි ණයදෙන ආයතන විසින් වාර්තා කළ ආකාරයට පුද්ගලයෙකු හෝ ආයතනයක් හඳුනාගැනීමේ තොරතුරු අන්තර්ගතවේ.

පුද්ගල හෝ ආයතනික නාමයන්, හඳුනාගැනීමේ අංකයන් (ජාතික හැඳුනුම්පත් අංකය හෝ ව්‍යාපාර ලියාපදිංචි අංකය), ලිපිනයන් සහ දුරකථන අංක සමග අනෙකුත් පුද්ගලික හෝ ව්‍යාපාරික තොරතුරු අන්තර්ගත වන අතර, එම තොරතුරුවල ආසන්නතම යාවත්කාලීනයන් මෙහි දක්වා ඇත.

## Subject Information

**Basic Information**

| | | | |
|---|---|---|---|
| **Full Name** | MARASINGHE WANNIARACHCHI KANKANAMGE | **Date of Birth** | 26-Mar-1234 |
| **Gender** | Male | **Citizenship** | Sri Lankan |

**Additional Information**

| | | | |
|---|---|---|---|
| **Employment** | Employed | **Profession** | – |
| **Employer Name** | HOSPITALNUWARAELIYA | **Business Name** | WANNIARACHCHI |

**Address**

| | | | |
|---|---|---|---|
| **Mail Address** | PIYASEWANA SINGHAGIRI, LUNUWILA WELIGAMA | **Permanent Address** | NO 870/1 RANMUTHUGALA ROAD KADAWATHA |
| **City** | Weligama | **City** | KADAWATHA |
| **Postal Code** | – | **Postal Code** | – |
| **District** | Matara | **District** | – |
| **Province** | Southern | **Province** | – |
| **Country** | Sri Lanka | **Country** | – |

**Contacts**

| | | | |
|---|---|---|---|
| **Mobile Phone** | 0 790 555 599 | **Mobile Phone 2** | – |
| **Phone Number** | 0 478 222 730<br>0 112 976 478 | **Phone Number 2** | – |
| **Email** | – | | |

**Main IDs**

| | | | |
|---|---|---|---|
| **NIC** | 123456789v | **Driving License Number** | – |
| **Passport** | – | **Business Registration Number** | – |
| **Business Registration Date** | – | | |

**සැ. යු.:** නිදර්ශනයක් ලෙස දැක්වීම සඳහා පුද්ගල ණය තොරතුරු වාර්තාවෙහි අන්තර්ගතයෙහි උපුටාගැනීමක් මෙහිදී දක්වා ඇති අතර ව්‍යාපාරික ණය තොරතුරු වාර්තාව පරිශීලනය කිරීමේදී එහි අන්තර්ගතයන් එයට අනුරූපව ඉදිරිපත් කෙරේ.

**History of Distinct Names**

| Institution | Changed Value | Valid From |
|---|---|---|
| SAMPATH BANK PLC | UDITHA MANO LEELARATHNE LIYANAGE | 31-Oct-2020 |
| COMMERCIAL CREDIT AND FINANCE PLC | MR UDITHA MANO | 31-Jan-2018 |
| COMMERCIAL BANK OF CEYLON PLC | UDITHA MANO LILARATNA LIYANAG | 28-Feb-2017 |
| PEOPLES BANK | LIYANAGE LEELARATHNA LIYANAGE | 31-Jan-2017 |
| NATIONS TRUST BANK PLC | LEELARATHNA LIYANAGE UDITHA MANO | 31-Jan-2017 |
| NATIONAL SAVINGS BANK | UDITHA MANO LEELARATHNE LIYANAGE | 31-Jan-2017 |
| PEOPLE'S LEASING AND FINANCE PLC | UDITHA LIYANAGE LEELARATHNA | 31-Jan-2017 |

**Other Historical Changes**

| Category | Changed Value | Valid From | Valid To |
|---|---|---|---|
| Mail Address | NO 47/2 NAWAM MAWATHA, NAWAMGODA HAWAELIYA, | 31-Aug-2017 | 30-Sep-2017 |
| Mail Address | BASE HOSPITAL NUWARA ELIYA | 31-Jan-2017 | 31-Jan-2017 |
| Mail Address | BASE HOSPITAL, NURSE`S QUARTERS | 31-Jan-2017 | 31-Dec-2017 |

| Category | Changed Value | Valid From | Valid To |
|---|---|---|---|
| Permanent Address | BERALELIYA WELIPITIYA WELIGAMA | 31-Jan-2017 | 31-Jan-2017 |
| Permanent Address | BASE HOSPITAL, NURSE`S QUARTERS | 31-Jan-2017 | 31-Dec-2017 |

| Category | Changed Value | Valid From | Valid To |
|---|---|---|---|
| Mobile Number | 0 112 976 478 | 31-Jan-2017 | 31-Dec-2017 |

**Historical Information (වාර්තා කර ඇති අතීත තොරතුරු)**

පුද්ගලයෙකුගේ හෝ ආයතනයක හඳුනාගැනීමේ තොරතුරු වල සිදුවී ඇති වෙනස්කම් සහ එම වෙනස්වීම් සිදු වී ඇති දිනයන් මෙහි දැක්වේ. එමගින් තොරතුරු වල නිවැරදි භාවයත් යාවත්කාලීන බවත් මෙමගින් ලබාගත හැක.

**History of Distinct Names (වාර්තා කර ඇති නාමයෙහි ඇති වෙනස්කම්)**

පුද්ගල හෝ ආයතනික නාමයන් හි, වෙනස්වීම් වාර්තා වී ඇත්නම්, එම වෙනස්වීම් සිදු වී ඇති දිනයන් සමග එම තොරතුරු වාර්තා කර ඇත්තේ කුමන ණය දෙන ආයතනයක් ද යන්න මෙමගින් ලබාගත හැක. එම ණය දෙන ආයතනවල නම් ස්වකීය ණය තොරතුරු වාර්තාවෙහි පමණක් දිස්වේ.

**Other Historical Changes (වාර්තා කර ඇති අනෙකුත් වෙනස්කම්)**

පුද්ගල හෝ ආයතනික වාර්තාවෙහි සඳහන් අනෙකුත් තොරතුරුවල සිදුවී ඇති වෙනස්වීම් (උදා. තැපැල් ලිපිනයන්, ස්ථිර ලිපිනයන්, දුරකථන අංකයන් සහ රැකියා විස්තර වල සිදුවී ඇති වෙනස්වීම්) සහ එම වෙනස්වීම් සිදු වී ඇති දිනයන් සමග මෙහි දැක්වේ.

**සැ. යු.:** වලංගු දිනයන් (දින සිට - දින දක්වා) සඳහන් කිරීම තුලින් වෙනස්වීම් සිදුවී ඇත්තේ කවදාද සහ යාවත්කාලීන වී ඇත්තේ කවදාද යන්න දැන ගත හැක.

## ණය ලකුණ (Credit Score)

ණය ලකුණ යනු ණය අවධානම් කළමනාකරණ ක්‍රියාවලියේදී වඩාත් ඵලදායි තීරණ ගැනීම සඳහා උපකාරීවන අංකන ක්‍රමයකි. එය ගුණාත්මක තොරතුරු ප්‍රමාණාත්මකව ඉදිරිපත් කිරීමක් ලෙස සැලකේ. ණය ලකුණ ගණනය කිරීමේදී පහත සඳහන් ප්‍රධාන මූලාශ්‍රයන් පිළිබඳව සලකා බලනු ලැබේ.

- ණය අපසුගෙවීම් චර්යාවන්
- අධි ණයගැතිභාවය
- පුද්ගලානුබද්ධ හෝ අයතනානුබද්ධ තොරතුරු
- පවතින ණය උපයෝගී කරගන්නා ආකාරයන්
- නව ණය පිළිබඳව කරනු ලබන විමසීම්
- ණය සඳහා ඉදිරිපත් කර ඇති ඇපකරයන්
- වාර්තා වී ඇති අගරු වූ චෙක්පත්

MyReport Plus හි සඳහන් වන ණය ලකුණ, අංක 03 කින් සමන්විත අගයක් වන අතර එය 250 සිට 900 දක්වා පරාසයක් ගනු ලැබේ. ණය ලකුණ, ණය අවධානම් කළමනාකරණය සමග බැඳී පවතින අතර ඉහල ණය ලකුණක් හිමිවීම, ණය දෙන ආයතනවලට අඩු ණය අවධානමක් ලෙස සලකන අතර පහල ණය ලකුණක් හිමිවීම, ඉහල ණය අවධානමක් ලෙස සැලකේ. ණය ලකුණ සෑමවිටම ස්ථිර අගයක් ලෙස නොපැවැත්වෙන අතර එය ණය තොරතුරු වල වාර්තා වීම හා යාවත්කාලීන වීම මත කාලයට අනුරූපව වෙනස් අගයක් ගත හැක.

**ණය ලකුණ වැදගත් වන්නේ ඇයි ?**

ණය ලකුණ (Credit Score) සමග ලබාදෙනු ලබන ණය අවධානම වර්ග කිරීම (Risk Grade), ණය ශක්‍යතාවය අවබෝධ කර ගැනීම සඳහා දිය හැකි යෝග්‍යතම මූලාශ්‍රයක් වේ.

ණය ලකුණ මගින් ලබාගත් හැකි ප්‍රතිලාභයන් ;


- ණය පහසුකමක් ඉල්ලුම් කිරීමට පෙර, ණය ශක්‍යතාවය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට උපකාරී වේ.
- ණය ඇගයීමේ ක්‍රියාවලියේදී, දරන පිරිවැය සහ කාලය අවම කරගැනීමට උපකාරී වේ.
- ණය ආපසු ගෙවීමේ පුරුදු / චර්යාවන්, විධිමත් කිරීමට උපකාරී වේ.
- ණය කළමනාකරණය විධිමත් කිරීමට උපකාරී වේ.
- විනයගරුක ණය කරුවෙකු වීමට උපකාරී වේ.

## Content of the Credit Score Section (ණය ලකුණු කොටසේ අන්තර්ගතයන්)

Scoring

| 546 | D1 | | 40.86% |
|---|---|---|---|
| Score | Risk Grade | Trend | Probability of Default |

Score History




| Month | Aug 21 | Sep 21 | Oct 21 | Nov 21 | Dec 21 | Jan 22 | Feb 22 | Mar 22 | Apr 22 | May 22 | Jun 22 | Jul 22 | Aug 22 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Score | 250 | 250 | 485 | 485 | 486 | 495 | 495 | 535 | 535 | 540 | 542 | 547 | 546 |
| Risk Grade | E3 | E3 | E1 | E1 | E1 | E1 | E1 | D2 | D2 | D1 | D1 | D1 | D1 |
| Probability of default | 100 | 100 | 73.88 | 73.88 | 73.43 | 69.18 | 69.18 | 47.12 | 47.12 | 44.25 | 43.11 | 40.3 | 40.86 |

**ණය ලකුණු** - දැනට පවතින ණය තොරතුරු පදනම් කරගෙන ගණනය කරන ලද ණය ලකුණු.
**අවධානම් ශ්‍රේණිගතය** - වර්ගීකරණය කරන ලද අවධානම් ශ්‍රේණිගත කිරීම *(වැඩිවිස්තර සඳහා Score Legends බලන්න).*
**ප්‍රවනතාවය** - ණය ලකුණෙහි වෙනස් වීමේ ප්‍රවනතාවය *(වැඩිවීම, අඩුවීම හෝ නොවෙනස්ව පැවතීම).*
**ගෙවීම් පැහැර හැරීමේ සම්භාවිතාව** - නිශ්චිත කාලයක් සඳහා ගණනය කරන ලද ගෙවීම් පැහැර හැරීමේ සම්භාවිතාව.
**ණය ලකුණෙහි විකාශනය** - පසුගිය මාස 12 තුළ ණය ලකුණු වෙනස් වූ ආකාරය ප්‍රස්ථාරයක් ලෙස පෙන්වයි.

Top Reason Codes

| Reason Code | Description |
|---|---|
| BAD1 | Customer in default |
| MSN1 | Negatively closed credit facility last 6 months |
| PAC1 | Very high overdue amount last 2 months |
| PDO1 | High ratio of due to total loan amount last 12 months |
| SXD2 | Evidence of bad payment behavior during last 2 years |

Scoring Legend




| | | |
|---|---|---|
| **A1-A3** | **Very Low Risk** | Based on Credit Histories |
| **B1-B3** | **Low Risk** | Based on Timely Payment Behavior |
| **C1-C3** | **Average Risk** | Based on Irregularities in Repayment of Over Indebtedness |
| **D1-D3** | **High Risk** | Based on High Probability of Defaulting on a Credit Facility |
| **E1-E3** | **Very High Risk** | Based on Default or Extreme Irregularities in Servicing Credit Facility |
| **XX** | **Not Scored** | Insufficient Information in the Database |

**Top Reason Codes (ණය ලකුණු සඳහා බලපා ඇති හේතූන්)**

- ණය ලකුණු සහ අවධානම් අගය සඳහා බලපා ඇති හේතූන් සවිස්තරාත්මකව මෙහි දක්වා ඇත. මෙමගින් ණය ලකුණු සහ අවධානම් ශ්‍රේණිය ගණනය කිරීම සඳහා බලපා ඇති හේතූන් සහ සිද්ධීන් විස්තර කෙරේ.

**Scoring Legend** - ගණනය කරන ලද ණය ලකුණු සඳහා හිමිවන අවධානම් ශ්‍රේණියන් හි අගයන්, Score Legend මගින් පෙන්නුම් කරයි.

**සැ. යු.:** ණය ලකුණු ගණනය කිරීම සඳහා ප්‍රමාණවත් දත්ත නොමැති අවස්ථාවන්හිදී, ණය ලකුණු "0" ලෙසත්, අවධානම් ශ්‍රේණිය "XX" ලෙසත් දක්වන අතර, ඒ සඳහා බලපා ඇති හේතුව **"ප්‍රමාණවත් දත්ත නොමැති වීම"** ලෙස දක්වයි.

**වැදගත් :** **ස්වකීය ණය තොරතුරු වාර්තාවේ අන්තර්ගත තොරතුරු වලට එරෙහිව ආරවුල් යොමු කලහැකි නමුත්, ලබා දී ඇති ණය ලකුණු හෝ අවධානම් ශ්‍රේණිය ට එරෙහිව, ආරවුල් යොමු කල නොහැක.**

## ණය පහසුකම් පිළිබඳ විස්තර (Credit Facility)

වර්තමානයේ පවතින සහ අනාගතයෙහි ගෙවීමට ඇති ණය සම්බන්ධ බැඳීම්වල සාරාංශයක් මෙමගින් ඉදිරිපත් කෙරේ. මෙහිදී පුද්ගලික හෝ ආයතනික වශයෙන් ලබාගන්නා ලද ණය පහසුකම්, බද්ධ ණය පහසුකම් සහ ඇපකරු ලෙස සම්බන්ධ වී ඇති ණය පහසුකම් සියල්ලම, සාරාංශ ගතව ඉදිරිපත් කෙරේ.

Debtor Summary per Sector - Last 5 Years (Amounts in LKR)

| Institution Category | Open Credit Facility | Closed Credit Facility | Credit Facilities in Arrears | Total Monthly Payments | Total Current Balance | Total Amount Granted | Total Amount in Arrears | Highest NDIA |
|---|---|---|---|---|---|---|---|---|
| License Commercialized Banks | 17 | 17 | ⚠ 4 | 7,774,479 | 19,550,115 | 33,016,755 | ⚠ 90,833 | ✖ 720 |
| License Finance Companies | 5 | 3 | ⚠ 3 | 436,889 | 20,820,930 | 30,340,000 | ⚠ 1,687,659 | ✖ 195 |
| License Leasing Companies | 0 | 0 | ✔ 0 | - | - | - | - | ✔ 0 |
| | | | | **8,211,368** | **40,371,045** | **63,356,755** | **1,778,492** | |

**Debtor Summary per Sector - Last 5 Years (Amounts in LKR) –**
**(පසුගිය වසර 05 තුල, ණයකරු ලෙස සහ බද්ධ ණයකරු ලෙස ලබාගත් ණය පහසුකම් - [රුපියල් වලින්])**

ණයකරු ලෙස සහ බද්ධ ණයකරු ලෙස ලබාගෙන ඇති සියළුම සක්‍රිය සහ ගෙවා නිමි ණය පහසුකම් සියල්ලෙහිම සාරාංශයක් මෙමගින් නිරූපණය කරයි. එය ණය දෙන ආයතනය අයත් ආයතන වර්ගය (Sector / Institution Category) අනුව විග්‍රහ කෙරේ. එහි සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරයි.

Guarantor Summary per Sector - Last 5 Years (Amounts in LKR)

| Institution Category | Open Credit Facility | Closed Credit Facility | Credit Facilities in Arrears | Total Monthly Payments | Total Current Balance | Total Amount Granted | Total Amount in Arrears | Highest NDIA |
|---|---|---|---|---|---|---|---|---|
| *License* Commercialized Banks | 1 | 0 | ⚠ 1 | 24,053 | 138,003 | 1,000,000 | ⚠ 24,053 | ⚠ 58 |
| License Finance Companies | 0 | 0 | ✔ 0 | - | - | - | - | ✔ 0 |
| License Leasing Companies | 2 | 0 | ✔ 0 | 0 | 1,646 | 25,000,000 | ✔ 0 | ✔ 0 |
| | | | | **24,053** | **139,649** | **26,000,000** | **24,053** | |

## Guarantor Summary per Sector - Last 5 Years (Amounts in LKR) –

**(පසුගිය වසර 05 තුල, ඇපකරු ලෙස සම්බන්ධ වී ඇති ණය පහසුකම් - [රුපියල් වලින්])**

ඇපකරු ලෙස සම්බන්ධ වී ඇති සියළුම සක්‍රිය සහ ගෙවා නිමි ණය පහසුකම් සියල්ලෙහිම සාරාංශයක් මෙමගින් නිරූපණය කරයි. එය ණය දෙන ආයතනය අයත් ආයතන වර්ගය (Sector / Institution Category) අනුව විග්‍රහ කෙරේ. එහි සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරයි.

## List of All Credit Facilities (සියළුම ණය පහසුකම්)

≡ List of All Credit Facilities 1–7

| Credit Facility Index | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
|---|---|---|---|---|---|---|---|
| Institution Category | LCB | LCB | LCB | LFC | LFC | LFC | LFC |
| Member | 7278 | 7278 | 7278 | 1401 | 1401 | 1137 | 1085 |
| Branch | 960 | 960 | 960 | 071 | 071 | CTB | CB |
| Credit Facility Type | CRCD | CRCD | CRCD | LOAN | LOAN | LOAN | LOAN |
| Credit Facility Status | ACTV | ACTV | ACTV | ACTV | MGCP | ACTV | ACTV |
| Ownership Indicator | PCD | SCD | SCD | OWN | JNT | GRT | GRT |
| Currency | LKR | LKR | LKR | LKR | LKR | LKR | LKR |
| Amount Granted/Limit | 120,000 | 120,000 | 120,000 | 413,500 | 1,575,000 | 150,000 | 186,016 |
| Current Balance | 126,117 | 114,947 | 115,567 | 452,344 | 2,152,764 | 82,592 | 176,555 |
| Amount in Arrears | 0 | 0 | 0 | 0 | 0 | 9,160 | 117,435 |
| Installment Amount | – | – | – | 45,234 | 39,866 | 9,179 | 6,366 |
| Amount Written Off | – | – | – | – | – | – | – |
| Last Update Date | 31-Oct-2022 | 30-Sep-2022 | 31-Oct-2021 | 30-Sep-2022 | 31-Oct-2022 | 31-Aug-2012 | 28-Feb-2019 |
| First Disbursement Date | 10-Oct-2017 | 30-Mar-2011 | 30-Mar-2011 | 29-Aug-2022 | 17-Oct-2019 | 21-Apr-2011 | 31-Oct-2013 |
| Last Payment Date | 09-Oct-2022 | – | 12-Oct-2021 | 29-Aug-2022 | 30-Aug-2022 | 26-Jul-2012 | 30-May-2017 |
| TRMN/RSHD/RSTR/WRTN Date | – | – | – | – | – | – | – |
| Credit Facility End Date | – | – | – | – | – | – | – |
| Repayment Type | DMND | DMND | DMND | MNLY | MNLY | WKLY | MNLY |
| Purpose of Credit Facility | 07:03:001 | 07:03:001 | 07:03:001 | 06:01:002 | 06:01:003 | 07:02:001 | 09:01:001 |
| Security Coverage | US | US | US | FS | FS | US | US |
| Guarantee Coverage | – | – | – | OG | OG | OG | OG |
| Entity Code | C2 | C3 | C4 | C1 | C5 | C8 | C9 |

## List of All Credit Facilities (සියළුම ණය පහසුකම්)

ණයකරු ලෙස සහ බද්ධ ණයකරු ලෙස ලබාගෙන ඇති ණය පහසුකම් සහ ඇපකරුවෙකු ලෙස සම්බන්ධ වී ඇති ණය පහසුකම් පිළිබඳ සියළුම තොරතුරු මෙම කොටසෙහි දක්වා ඇත. එය ණය පහසුකම ලබාගත් ආයතනය සහ ආයතනයේ වර්ගය, ණය පහසුකම් වර්ගය, එම ණය පහසුකම සක්‍රිය හෝ වසා තිබේද, ණයට ගත් මුදල, ගෙවිය යුතු මුදල, හිඟ මුදල් සහ හිඟ හිටි දින ගණන යනාදී තොරතුරු ඉදිරිපත් කරයි. මෙම කොටසේ දක්වා ඇති බොහෝ තොරතුරු කෙටි නාම **(කේත / Catalog Values)** ලෙස ඉදිරිපත් කර ඇති අතර එම කෙටි නාමයන් වල විග්‍රහයන් වාර්තාව අවසානයේ ඇති **"පැහැදිලි කිරීම්" (Explanations)** මගින් සවිස්තරාත්මකව දක්වා ඇත.

දැනට කාර්යාංශය භාවිතා කරන සියළුම කේතයන් (2023 ජනවාරි මස) සහ ඊට අදාළ විස්තර ඔබගේ දැනගැනීම පිණිස, වාර්තාවේ දැක්වෙන අනුපිළිවෙලට පහත සඳහන් කර ඇත.

**Credit Facility Index** - එක් එක් ණය පහසුකම සඳහා වෙන්කළ අනු අංකය.

**Institution Category** - ණය දෙන ආයතනය අයත් ආයතන වර්ගය.

- **LCB** - බලපත්‍රලාභී වාණිජ බැංකු
- **LSB** - බලපත්‍රලාභී විශේෂ බැංකු
- **LLC** - බලපත්‍රලාභී ලීසිං සමාගම්
- **LFC** - බලපත්‍රලාභී මූල්‍ය සමාගම්
- **OOG** - කාර්යාංශ පනතට අනුකූලව ණය දෙන ආයතන ලෙස පිළිගෙන ඇති අනෙකුත් ආයතන

**Member & Branch (Institution & Branch)** - ණය පහසුකම වාර්තා කරන ලද ණය දෙන ආයතනය සහ ශාඛාවේ කේත අංක.

**සැ. යු.:** ණය තොරතුරු වාර්තාකර ඇති ණය දෙන ආයතන පමණක් කේත වගුවේ දක්වා ඇත. මෙම කේතයන් කාර්යාංශය මගින් අදාළ ණය දෙන ආයතන සහ ශාඛා හඳුනා ගැනීම සඳහා නිකුත් කරන ලද ඒවා වේ.

**Credit Facility Type** - ණය වර්ගය.

**BKGR** - බැංකු ඇපකරය / Bank Guarantee
**CRCD** - ක්‍රෙඩිට් කාඩ්පත / Credit Card
**HRPH** - කල්බදු / Hire Purchase
**LEAS** - ලීසිං / Leasing
**LOAN** - ණය / Loan
**MILN** - ක්ෂුද්‍ර ණය / Micro Loan
**OVDR** - බැංකු අයිරා / Overdraft
**LTCR** - ණයවර ලිපි / Letter of Credit
**FACT** - ෆැක්ටරින් / Factoring
**BILD** - බිල්පත් වට්ටම් කිරීම / Bills Discounting
**HYPO** - හයිපොතිකේෂන් / Hypothecation
**CMBF** - ඒකාබද්ධ ණය පහසුකම / Combined Facility
**CODU** - පාරිභෝගික පහසු ගෙවීමේ ක්‍රම මත ප්‍රදානිත ණය / Consumer Durables
**AAIB** - ආනයන බිල්පත් මත ප්‍රදානිත ණය / Advances Against Import Bills
**BGCN** - බැංකු ඇපකරය - ඉදිකිරීම් / Bank Guarantee - Construction Related
**BGNC** - බැංකු ඇපකරය - ඉදිකිරීම් නොවන / Bank Guarantee - Non Construction Related
**APRS** - අපනයන - පෙර නැව්ගත කිරීම් මත ප්‍රදානිත ණය / Advances Against Export Pre Shipment
**APTS** - අපනයන - පසු නැව්ගත කිරීම් මත ප්‍රදානිත ණය / Advances Against Export Post Shipment
**COCR** - ආයතනික ක්‍රෙඩිට් කාඩ්පත / Corporate Credit Card
**OTHR** - අනෙකුත් ණය (ඉහත දක්වා නොමැති) / Other Credit

**Credit Facility Status** - ණය පහසුකම පවත්නා ස්වභාවය.

**ACTV** - දැනට ක්‍රියාකාරිත්වයේ ඇත / Active
**LGAL** - නීතිමය පියවර ගෙන ඇත / Legal Action
**LBGV** - රජය ද වගකීම සඳහා බැඳී සිටී / Liability Assumed by Government
**NATD** - ස්වභාවික විපත් බලපා ඇත / Natural Disaster Affected
**CLSD** - වසා ඇත (ණය දෙන ආයතනය විසින්) / Closed
**RSHD** - ප්‍රතිසැලසුම් කර ඇත / Rescheduled
**SETL** - සම්පූර්ණයෙන්ම ගෙවා නිමකර ඇත / Settled
**TRMN** - සේවාව හෝ පහසුකම අත්හිටුවා ඇත / Terminated
**WRTN** - පූර්ණ හෝ අර්ධ වශයෙන් කපා හරින ලද / Written Off
**R&SL** - හිමිකම පවරාගෙන විකුණා ඇත (ණය දෙන ආයතනය විසින්) / Repossessed & Sold
**R&ST** - හිමිකම පවරාගැනීමෙන් පසු පියවා ඇත / Repossessed & Settled
**PACT** - පරාටේ නීතිය යටතට යොමුකර ඇත / Parate Action
**ARBT** - බේරුම් කිරීම සඳහා යොමුකර ඇත / Arbitration
**STTC** - අධිකරණයේ මැදිහත්වීම මත ගෙවා නිමකර ඇත / Settled Through Court
**FCAN** - පහසුකම අවලංගු කර ඇත (ණය දෙන ආයතනය විසින්) / Facility Cancelled
**RPOS** - හිමිකම පවරාගෙන ඇත (ණය දෙන ආයතනය විසින්) / Repossessed
**SPWO** - කොටසක් කපා හැර ගෙවා නිමකර ඇත / Settled Part Written Off
**SGDR** - රජයේ ණය සහන වැඩසටහන යටතේ ගෙවා නිමකර ඇත / Settled under the Government Debt Relief Program
**RSTR** - ප්‍රතිව්‍යුහගත කර ඇත / Restructured
**MGCP** - කොවිඩ් 19 - ණය ආධාර වැඩසටහන යටතේ ණය ආපසු ගෙවීම් සහනයක් ලබාගෙන ඇත / Moratorium granted under the Government Credit Support Program - Covid 19

**සැ. යු.:** ණය පහසුකම අවසන්වරට යාවත්කාලීන වූ හෝ වාර්තා වී ඇති දිනට පැවති ස්වභාවය මෙහි දැක්වේ.

**Ownership Indicator** - ණය පහසුකමෙහි හිමිකාරත්වය.

- **OWN** - තමන් විසින් (තනි පුද්ගල ණයකරුවෙකු ලෙස) ලබාගත් / Owned
- **PCD** - මූලික කාඩ්පත හිමිකරු / Primary Card Holder
- **SCD** - උප / අතිරේක කාඩ්පත් හිමිකරු / Supplementary Card Holder
- **JNT** - බද්ධ ණයකරු / Joint Borrower
- **GRT** - ඇපකරු / Guarantor

**Currency** - ණය පහසුකම් ප්‍රදානය කළ මුදල් වර්ගය.

**Amount Granted/Limit** - මෙමගින් ප්‍රදානය කර ඇති ණය මුදල දැක්වේ. බැංකු අයිරා සහ ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා මෙය අනුමත ණය සීමාව ලෙස පිළිගැනේ.

**Current Balance** - ණය මුදල අවසන්වරට වාර්තා වී ඇති දිනය (Last Update Date) වන විට අනාගතයේදී සම්පූර්ණයෙන්ම ගෙවා නිම කිරීමට ඉතිරිව ඇති මුළු මුදල මෙමගින් දැක්වේ. මෙම වටිනාකම තුල ප්‍රදානිත මුදල, පොලිය, හිඟ මුදල් සහ අනෙකුත් සේවා සහ පහසුකම් ගාස්තු ඇතුලත් විය හැක.

**Amount in Arrears** - අවසන් වරට වාර්තා වී ඇති දිනට (Last Update Date) පැවති හිඟ මුදල මේ යටතේ දැක්වේ.

**Installment Amount** - වාරික වශයෙන් ගෙවීම් සිදුකරන විටෙක එක් වාරිකයක වටිනාකම මෙමගින් දැක්වේ.

**Amount Written Off** - ණය පහසුකමක් අර්ධ හෝ පූර්ණ වශයෙන් කපාහැර ඇති අවස්ථාවක, එම කපාහැර ඇති වටිනාකම මෙමගින් දැක්වේ.

**Last Update Date** - ණය දෙන ආයතන විසින් අවසන්වරට ණය පහසුකම පිළිබඳ තොරතුරු යාවත්කාලීන කළ දිනය.

**First Disbursement Date** - ණය පහසුකම ප්‍රදානය කළ දිනය.

**Last Payment Date** - ණය වාරිකය හෝ අදාළ ගෙවීමක් සිදුකළ ආසන්නතම දිනය.

**TRMN/RSHD/RSTR/WRTN Date** - යම් ණය පහසුකමක් අත්හිටුවා ඇති විටෙක හෝ ප්‍රතිසැලසුම් කර ඇති විටෙක හෝ ප්‍රතිව්‍යුහගතකර ඇති විටෙක හෝ පූර්ණ හෝ අර්ධ වශයෙන් කපා හරින ලද ඇති විටෙක එසේ කළ දිනය.

**Credit Facility End Date** - ණය පහසුකම ගෙවා නිම කළ හෝ අවසන් කළ දිනය මෙමගින් දැක්වේ. මෙම දිනය ණය පහසුකමේ ස්වභාවය (Status) වාර්තා කර ඇති ආකාරය අනුව අර්ථ ගන්වාගත යුතුය.

**Repayment Type** - ගිවිස ගෙන ඇති ණය ආපසු ගෙවීමේ ක්‍රමය.

- **BALN (Balloon)** - ක්‍රමයෙන් වටිනාකම හීන වී යන පරිදි කොටස් වශයෙන් ගෙවීම
- **BMLY (Bi – Monthly)** - දෙමසකට වරක් ගෙවීම
- **BULT (Bullet)** - සමස්ථ ණය මුදල එකවර ආපසු ගෙවීම
- **DMND (On Demand)** - ඉල්ලුම මත ගෙවීම
- **MNLY (Monthly)** - මාසිකව ගෙවීම
- **QRLY (Quarterly)** - කාර්තු වශයෙන් ගෙවීම
- **SMAN (Semi-Annual)** - අර්ධ වාර්ෂිකව ගෙවීම
- **WKLY (Weekly)** - සතිපතා ගෙවීම
- **BWLY (Bi – Weekly)** - දෙසතියකට වරක් ගෙවීම
- **ANLY (Annually)** - වාර්ෂිකව ගෙවීම
- **REFM (Repayment Every 04 Months)** - සිව් මසකට වරක් ගෙවීම
- **RENM (Repayment Every 09 Months)** - මාස නවයකට වරක් ගෙවීම
- **DALY** - දිනපතා ගෙවීම

**Purpose of Credit Facility** - ණය පහසුකම ලබාගත් / ප්‍රදානය කළ පරමාර්ථය හා අදාළ කේතයන් මෙමගින් දැක්වේ. වැඩි විස්තර සඳහා "පැහැදිලි **කිරීම**" (**Explanations**) කොටස භාවිතා කරන්න.

**Coverage** - ණය පහසුකමක් යම් ආකාරයක ආවරණයකට හෝ බැඳීමකට යටත්ව ප්‍රදානයකර ඇති ද යන වග (Security or Guarante Coverage). වැඩි විස්තර සඳහා "**පැහැදිලි කිරීම**" (**Explanations**) කොටස භාවිතා කරන්න.

| **Security Coverage** | | **Guarantee Coverage** | |
|---|---|---|---|
| **FS** | - පූර්ණ සුරැකුම් ඇත / Fully Secured | **OG** | - අනෙකුත් ඇප ලබාගෙන ඇත / Other Guarantee |
| **PS** | - අර්ධ සුරැකුම් ඇත / Partially Secured | **NG** | - ඇප ලබාගෙන නොමැත / Not Guaranteed |
| **US** | - සුරැකුම් නොමැත / Unsecured | **GG** | - රජයේ ඇපවීම් / Government Backed Guarantee |

**Entity Code** - ණය පහසුකම හා සම්බන්ධ වී ඇති අනෙකුත් පාර්ශවයන් (Credit Facility Relations) පිළිබඳ විස්තර දැනගැනීම සඳහා යොමු අංකයක් ලෙස භාවිතා කරන අතර යම් ණය පහසුකමක් හා සම්බන්ධව යොමු කර ඇති ආරවුලක් (Dispute) දැනගැනීම සඳහා යොමු අංකයක් ලෙස ද මෙය භාවිතා කරයි.

## Payment (ගෙවුම් අතීතය)

මෙම කොටසෙහි දැක්වෙන තොරතුරු සැමවිටම ඉහත විස්තර කරන ලද ණය පහසුකම් පිළිබඳ විස්තර (List of All Credit Facility Details) සමඟ බැඳී පවතී. ඒ අනුව ණය පහසුකම සඳහා වෙන්කළ අනු අංකයට සම්බන්ධ එහි "**ගෙවුම් අතීතය**" (Payment History) මෙම කොටසෙහි අදාළ අනු අංකය යටතේ පෙන්නුම් කෙරේ. මෙම ගෙවුම් අතීතය ආසන්නතම පසුගිය මාස 24 ක කාලයකට සීමා වේ.

≡ Payment 1–7

| Credit Facility Index | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
|---|---|---|---|---|---|---|---|
| 2023 Jan | – | – | – | – | – | – | – |
| 2022 Dec | – | – | – | – | – | – | – |
| 2022 Nov | – | – | – | – | – | 791 | – |
| 2022 Oct | 310 | 277 | 0 | 0 | 21 | 761 | – |
| 2022 Sep | 282 | 246 | 0 | 0 | 22 | 730 | – |
| 2022 Aug | 249 | 216 | 0 | 0 | 21 | 700 | – |
| 2022 Jul | 218 | 185 | 13 | 0 | 0 | 669 | – |
| 2022 Jun | 189 | 154 | 0 | 0 | 0 | 638 | – |
| 2022 May | 157 | 124 | 0 | 0 | 0 | 608 | – |
| 2022 Apr | 125 | 93 | 0 | 0 | 0 | 577 | – |
| 2022 Mar | – | 428 | 13 | 0 | 0 | 547 | – |
| 2022 Feb | 65 | 397 | 10 | 0 | 0 | 516 | – |
| 2022 Jan | 37 | 369 | 13 | 0 | 0 | 488 | – |
| 2021 Dec | 0 | 338 | 13 | 0 | 0 | 457 | 13 |
| 2021 Nov | 0 | 307 | 0 | 0 | 0 | 426 | – |
| 2021 Oct | 0 | 277 | 13 | 0 | 0 | 396 | – |
| 2021 Sep | 127 | 246 | 12 | 0 | 0 | 365 | – |
| 2021 Aug | 96 | 216 | 13 | 0 | 0 | 365 | – |
| 2021 Jul | 65 | 185 | 13 | 0 | 0 | 334 | – |
| 2021 Jun | 36 | 154 | 12 | – | – | 303 | – |
| 2021 May | 35 | 124 | 13 | 0 | 0 | 273 | – |
| 2021 Apr | 0 | 93 | 0 | 0 | 0 | 242 | – |
| 2021 Mar | 0 | 185 | 13 | 0 | 0 | 212 | 13 |
| 2021 Feb | 0 | 154 | 10 | 0 | 18 | 181 | – |

**සැ.යු.:** - එක් එක් මාසයට අදාළ කොටස තුල දැක්වෙන අගයන් වනුයේ එම මාසයේ අවසාන දිනය (Last Update Date) වන විට හිඟ මුදලක් (Arrears Amount) පැවතියේ නම්, එය ගෙවීම සඳහා අතපසු වී ඇති දින ගණන නැතහොත් හිඟ හිටි දින ගණන වේ (Number of Days in Arrears - NDIA).

මෙහි ආසන්නතම හිඟ දින ගණනට අදාල හිඟ ඇති මුදල සඳහා Credit Facility Details වගුව බලන්න.

- හිඟ දින ගණන **0-29** අතර නම් - නිරූපකය (icon) කොළ වර්ණයෙන් සහ "✓" ලකුණෙන් දක්වා ඇත.
- හිඟ දින ගණන **30-89** අතර නම් - නිරූපකය (icon) දුඹුරු වර්ණයෙන් සහ "△" ලකුණෙන් දක්වා ඇත.
- හිඟ දින ගණන **90** කට වැඩි නම් - නිරූපකය (icon) රතු වර්ණයෙන් සහ "⊗" ලකුණෙන් දක්වා ඇත.

වැඩි විස්තර සඳහා වාර්තාවේ සඳහන් පහත "**පැහැදිලි කිරීම්**" (**Explanations**) කොටස භාවිතා කරන්න.

| Explanations | | | | | |
|---|---|---|---|---|---|
| | **Delinquency status of Payment calendar** | ✓ **0-29 past due days** | △ **30-89 past due days** | ⊗ **More than 90 past due days** | N/A **No data available** |
| | **Other Abbreviations** | **NDIA** Number of Days in Arrears | **-** No data available | | |

## Summary of Closed Credit Facilities (Last 5 Years) – (පසුගිය වසර 05 තුල, ගෙවා නිමි ණය පහසුකම්වල සාරාංශය)

පසුගිය වසර පහක කාලය තුළ තනි පුද්ගලයකු ලෙස ලබාගත්, බද්ධ ණයකරුවකු (Joint Borrower) ලෙස සම්බන්ධ වූ සහ ඇපකරුවකු ලෙස බැඳීම් ප්‍රකාශ කළ සියළු ගෙවා නිමි ණය පහසුකම්වල සංඛ්‍යාත්මක තොරතුරු ඒවා **ප්‍රදානය කළ කාලය අනුව (Granted Period)** පෙළ ගස්වා ඇත. LKR ණය පහසුකම් සහ LKR නොවන ණය පහසුකම් වෙන වෙනම දක්වයි. (LKR - ශ්‍රී ලංකා රුපියල්)

Summary of Closed Credit Facilities (Last 5 Years)

LKR Credit Facilities

| Period | Total No. of Credit Facilities as Debtor | Total Amount Granted as Debtor | Total No. of Credit Facilities as Guarantor | Total Amount Granted as Guarantor | Total No. of Credit Facilities | Total Amount Granted |
|---|---|---|---|---|---|---|
| 2022-11 - 2021-12 | 22 | 233,469,056 | 0 | 0 | 22 | 233,469,056 |
| 2021-11 - 2020-12 | 399 | 3,632,561,684 | 0 | 0 | 399 | 3,632,561,684 |
| 2020-11 - 2019-12 | 161 | 1,026,102,165 | 0 | 0 | 161 | 1,026,102,165 |
| 2019-11 - 2018-12 | 202 | 2,263,783,870 | 0 | 0 | 202 | 2,263,783,870 |
| 2018-11 - 2017-12 | 233 | 3,669,201,101 | 1 | 100,000,000 | 234 | 3,769,201,101 |
| | **1,017** | **10,825,117,876** | **1** | **100,000,000** | **1,018** | **10,925,117,876** |

Non-LKR Credit Facilities (Amounts in LKR)

| Period | Total No. of Credit Facilities as Debtor | Total Amount Granted as Debtor | Total No. of Credit Facilities as Guarantor | Total Amount Granted as Guarantor | Total No. of Credit Facilities | Total Amount Granted |
|---|---|---|---|---|---|---|
| 2022-11 - 2021-12 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 2021-11 - 2020-12 | 30 | 130,422,287 | 0 | 0 | 30 | 130,422,287 |
| 2020-11 - 2019-12 | 81 | 390,668,304 | 0 | 0 | 81 | 390,668,304 |
| 2019-11 - 2018-12 | 90 | 471,553,999 | 0 | 0 | 90 | 471,553,999 |
| 2018-11 - 2017-12 | 121 | 769,786,934 | 0 | 0 | 121 | 769,786,934 |
| | **322** | **1,762,431,524** | **0** | **0** | **322** | **1,762,431,524** |

**වැදගත් :** වාර්තාව ජනනය කරන අවස්ථාවේ පවතින විනිමය අනුපාතයට අනුව LKR නොවන ණය පහසුකම් වල අගයන් ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කොට ඉදිරිපත් කරයි.

**Details of Closed Credit Facilities (Last 5 Years) -** (පසුගිය වසර 05 තුල, ගෙවා නිමි ණය පහසුකම්වල විස්තර)

ඉහත සඳහන් කළ පසුගිය වසර පහක කාලය තුළ ගෙවා නිමි ණය පහසුකම්වල විස්තර ඒවායෙහි **පහසුකම් වර්ගය (Credit Facility Type)** අනුව සංඛ්‍යාත්මකව දක්වා ඇත. LKR ණය පහසුකම් සහ LKR නොවන ණය පහසුකම් වෙන වෙනම දක්වයි. (LKR - ශ්‍රී ලංකා රුපියල්)

Details of Closed Credit Facilities (Last 5 Years)

LKR Credit Facilities

| Credit Facility Type | Total No. of Credit Facilities as Debtor | Total Amount Granted as Debtor | Total No. of Credit Facilities as Guarantor | Total Amount Granted as Guarantor | Total No. of Credit Facilities | Total Amount Granted |
|---|---|---|---|---|---|---|
| LOAN | 974 | 10,285,663,843 | 1 | 100,000,000 | 975 | 10,385,663,843 |
| OVDR | 4 | 0 | - | - | 4 | 0 |
| FACT | 5 | 125,000,000 | - | - | 5 | 125,000,000 |
| BGNC | 5 | 6,462,000 | - | - | 5 | 6,462,000 |
| BGCN | 22 | 262,385,758 | - | - | 22 | 262,385,758 |
| LTCR | 7 | 145,606,275 | - | - | 7 | 145,606,275 |
| | **1,017** | **10,825,117,876** | **1** | **100,000,000** | **1,018** | **10,925,117,876** |

Non-LKR Credit Facilities (Amounts in LKR)

| Credit Facility Type | Total No. of Credit Facilities as Debtor | Total Amount Granted as Debtor | Total No. of Credit Facilities as Guarantor | Total Amount Granted as Guarantor | Total No. of Credit Facilities | Total Amount Granted |
|---|---|---|---|---|---|---|
| LTCR | 315 | 1,718,406,997 | - | - | 315 | 1,718,406,997 |
| AAIB | 7 | 44,024,527 | - | - | 7 | 44,024,527 |
| | **322** | **1,762,431,524** | **0** | **0** | **322** | **1,762,431,524** |

## ව්‍යාපාරික සබඳතා පිළිබඳ තොරතුරු (Relations)

තනි පුද්ගල හෝ හවුල් ව්‍යාපාර සඳහා පමණක් ඇති සබඳතා වාර්තා වී ඇත්නම් එම තොරතුරු මෙහි දක්වේ. එසේ වාර්තා කර ඇති සියළු සබඳතා, සවිස්තරාත්මකව List of All Involvements යටතේ දක්වා ඇත.

**Relations**

Relations

0
Related Subjects

⚠ 2
Involved Subjects

වාර්තා වී ඇති සබඳතා පහත සඳහන් කොටස් දෙකකින් සමන්විත වේ.

1. ණය පහසුකම් හා සම්බන්ධ වී ඇති අනෙකුත් පාර්ශවයන් (List of All Credit Facility Relation)
2. තනි පුද්ගල හෝ හවුල් ව්‍යාපාර සඳහා ඇති සබඳතා (List of All Involvements)

**List of All Credit Facility Relation** (ණය පහසුකම් හා සම්බන්ධ වී ඇති අනෙකුත් පාර්ශවයන්)

කාර්යාංශයට වාර්තා කර ඇති අදාළ ණය පහසුකම හා සම්බන්ධ අදාළ පාර්ශවයන් මෙහි විස්තර කරයි.

- බද්ධ ණයකරුවෙකු ලෙස ඇති ණය පහසුකම් සඳහා සම්බන්ධ වී ඇති අනෙකුත් ණයකරුවන් සහ ඇපකරුවන් පිළිබඳ විස්තර.
- ඇපකරුවකු ලෙස ඇති ණය පහසුකම් සඳහා සම්බන්ධ වී ඇති ණයකරුවන් සහ අනෙකුත් ඇපකරුවන් පිළිබඳ විස්තර.
- ණයකරුවෙකු ලෙස ඇති ණය පහසුකම් සඳහා සම්බන්ධ වී ඇති ඇපකරුවන් පිළිබඳ විස්තර.

List of All Credit Facility Relation

| Entity Code | Role of Subject | ID Number | Full Name | Mail Address | Valid From | Valid To |
|---|---|---|---|---|---|---|
| C5 | Co-Debtor, Co-Applicant | 726351476V | HEWA NARADENIYAGE SUDARSHANI CHANDRADASA | 164D,HOKANDARA ROAD, PANNIPITIYA. | 30-Sep-2017 | - |
| C6 | Guarantor | 726351476V | HEWA NARADENIYAGE SUDARSHANI | 164D,HOKANDARA ROAD, PANNIPITIYA | 30-Sep-2019 | - |
| C6 | Guarantor | 726351476V | HEWA NARADENIYAGE SUDARSHANI | 164D,HOKANDARA ROAD, PANNIPITIYA | 31-Dec-2021 | - |
| C13 | Guarantor | 550800476V | SHAMENDRA VITHANAGE ANANDA CHANDRADASA | NO:361 A, GALLE ROAD, NUPE, NAWAGANGODA, | 31-Jul-2021 | - |
| C13 | Guarantor | 880160724V | GUNASEKARA GAMINI JAYARATHNA | NO.116,SWARAJ ROAD GALLE ROAD, MATARA | 31-Jul-2021 | - |
| C28 | Main Debtor, Main Applicant | 199327504160 | WANNIARACHCHI KANKANAMGE SHAMIL DILSHAN | ATHURUGIRIYA ROAD KOTTAWA | 31-Dec-2020 | - |

**Entity Code** - අනෙකුත් පාර්ශවයන් සම්බන්ධ වී ඇත්තේ කුමන ණය පහසුකමකටද යන්න මෙමගින් හඳුනාගත හැක.

**Role of Subject** - ණය පහසුකමට සම්බන්ධ වී ඇති අනෙකුත් පාර්ශවයන් ගේ ඇති හිමිකාරත්වය. (ණයකරු, බද්ධ ණයකරු හෝ ඇපකරු).

**ID Number** - සම්බන්ධිත පාර්ශවයන්ගේ හඳුනාගැනීමේ අංකයන්.

**Full Name** - සම්බන්ධිත පාර්ශවයන්ගේ නාමයන්.

**Mail Address** - සම්බන්ධිත පාර්ශවයන්ගේ වාර්තා කර ඇති ලිපිනයන්.

**Valid from & Valid to** - වාර්තා වී ඇති සබඳතා වල වලංගු කාලය.

**List of All Involvements** **(තනි පුද්ගල හෝ හවුල් ව්‍යාපාර සඳහා වාර්තා කර ඇති සබඳතා)**

තනි පුද්ගල හෝ හවුල් ව්‍යාපාර සඳහා පමණක් ඇති සබඳතා වාර්තා වී ඇත්නම් එම තොරතුරු මෙහි දක්වේ. එසේ වාර්තා කර ඇති සියළු සබඳතා, සවිස්තරාත්මකව List of All Involvements යටතේ දක්වා ඇත.

List of All Involvements

| Entity Code | Type of Relation | ID Number | Full Name | Mail Address | Valid From | Valid To |
|---|---|---|---|---|---|---|
| R32 | Soleowner | M103388 | SUNAGRO FOODS | NO 11 ATHURUGIRIYA ROAD KOTTAWA | 30-Nov-2021 | - |
| R33 | Soleowner | 928660 | RATHNA PACKAGING | NO 29/2 HOKANDARA ROAD PANNIPITIYA | 30-Nov-2021 | - |

**Entity Code** - වාර්තා කර ඇති ව්‍යාපාරික සබඳතාවන් හඳුනාගැනීමේ යොමු අංකය. එය ආරවුලක් ලියාපදිංචි කිරීමකදී ද භාවිතා වේ.

**Type of Relation** - වාර්තා කර ඇති ව්‍යාපාරික සබඳතාවයේ වර්ගය. (තනි පුද්ගල හෝ හවුල් ව්‍යාපාර)

**ID Number** - සම්බන්ධිත ව්‍යාපාරික පාර්ශවයන්ගේ හඳුනාගැනීමේ අංකයන්.

**Full Name** - සම්බන්ධිත ව්‍යාපාරික පාර්ශවයන්ගේ නාමයන්.

**Mail Address** - සම්බන්ධිත ව්‍යාපාරික පාර්ශවයන්ගේ වාර්තා කර ඇති ලිපිනයන්.

**Valid from & Valid to** - වාර්තා වී ඇති සබඳතා වල වලංගු කාලය.

## ණය තොරතුරු සම්බන්ධව කළ විමසීම් (Inquiries)

ස්වකීය ණය තොරතුරු වාර්තාව පසුගිය සය (06) මසක කාලයක් තුලදී ලබාගෙන ඇති වාර ගණන සහ කොපමණ ණය දෙන ආයතන සංඛ්‍යාවක් පසුගිය සය (06) මසක කාලයක් තුලදී එම ණය තොරතුරු වාර්තාව ලබාගත්තේද යන්න පිළිබඳ විස්තර මෙහි දැක්වේ.

Self-Inquiries During the Last 6 Months - ස්වකීය ණය තොරතුරු වාර්තාව පසුගිය සය (06) මසක කාලයක් තුලදී ලබාගෙන ඇති වාර ගණන.

Inquiring Members During the Last 6 Months - කොපමණ ණය දෙන ආයතන සංඛාවක් පසුගිය සය (06) මසක කාලයක් තුලදී ණය තොරතුරු වාර්තාව ලබාගත්තේද.

Inquiries (1 Month, 3 Months, 6 Months) - සිදු කරන ලද විමසීම්වල වාර ගණන මත පදනම්ව, පසුගිය මාස (06) සඳහා විමසීම් සංඛ්‍යාව පෙන්වයි.

**Inquiries**

| | | | |
|---|---|---|---|
| Inquiries | 0<br>Self Inquiries During the Last 6 Months | 1<br>Inquiring Members During the Last 6 Months | |
| Inquiries | 0<br>1 Month | 0<br>3 Months | 4<br>6 Months |

**Inquiries During the Last 6 Months –** **(පසුගිය සය (06) මසක කාලයක් තුලදී කරන ලද සියළු විමසීම්)**

Inquiries During the Last 6 Months

| Member | Reason for Inquiry | Date of Inquiry |
|---|---|---|
| NATIONAL BANK PLC | Monitoring and reviewing of an existing borrower | 19-Aug-2022 |
| NATIONAL BANK PLC | Evaluating of a borrower for a new credit facility | 17-Aug-2022 |
| NATIONAL BANK PLC | Evaluating of a borrower for a new credit facility | 16-Aug-2022 |
| NATIONAL BANK PLC | Monitoring and reviewing of an existing borrower | 12-Aug-2022 |

**Member** - විමසීම කරන ලද ණය දෙන ආයතනයේ නම.
**Reason for Inquiry** - විමසීම සඳහා පදනම් වූ අවසරලත් හේතුව.
**Date of Inquiry** - විමසීම කළ දිනය.

**වැදගත් :** ණය තොරතුරු කාර්යාංශයේ පනතට අනුකූලව, ණය දෙන ආයතනයන්ට ණය තොරතුරු වාර්තාව ලබාගත හැකි වන්නේ පහත සඳහන් කාර්යයන (Permissible Purposes) සඳහා පමණි.

- ණයකරුවකු ලෙස නව ණය පහසුකමක් සඳහා යෝග්‍යතාවය ඇගයීමට.
- ඇපකරුවකු ලෙස නව ණය පහසුකමක් සඳහා සළකා බැලීමට.
- හවුල්කරුවකු / තනි පුද්ගල ව්‍යාපාරිකයෙකු ලෙස නව ණය පහසුකමක් සඳහා සළකා බැලීමට.
- ලියාපදිංචි සමාගමක අධ්‍යක්ෂකවරයකු ලෙස නව ණය පහසුකම් සඳහා සළකා බැලීමට.
- දැනට සිටින ණයකරුවකුගේ ණය තොරතුරු නිරීක්ෂණය කිරීමට.
- ජංගම ගිණුමක් විවෘත කිරීම සඳහා.

**ඉහත සඳහන් අවසරලත් හේතුන් වලින් පරිබාහිරව, ණය තොරතුරු විමසා තිබීම, කාර්යාංශ පනතේ විධිවිධානයන්ට අනුව වරදක් ලෙස සැලකේ.**

## දත්ත පිළිබඳ ආරවුල් **(Disputes)**

ස්වකීය ණය තොරතුරු වාර්තාවෙහි (MyReport Plus) අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් ලියාපදිංචි කරන ලද දත්ත පිළිබඳ ආරවුල් මෙමගින් විස්තර කෙරේ.

### Disputes

| | | | | | |
|---|---|---|---|---|---|
| Active Disputes | ⚠ 1 Credit Facility Disputes | ⚠ 1 Other Data Disputes | ✔ 0 Dishonoured Cheque Disputes | ✔ 0 Utilities Disputes | ✔ 0 Registered in Court |
| Closed Disputes | 0 Credit Facility Disputes | 0 Other Data Disputes | 0 Dishonoured Cheque Disputes | 0 Utilities Disputes | ✔ 0 False Disputes |

ලියාපදිංචි කරන ලද දත්ත පිළිබඳ ආරවුල් **"සක්‍රිය ආරවුල්"** යටතේ පෙන්නුම් කරන අතර එමගින් එම තොරතුරු පරිශීලනය කරනු ලබන යම් ණය දෙන ආයතනයකට එම තොරතුරු වල නිවැරදි භාවය පිළිබඳව යම් අවබෝධයක් ලබාගත හැක. විසඳා ඇති ආරවුල් පිළිබඳ විස්තරද මෙමගින් දක්වා ඇත.

## List of all Disputes (යොමු කර ඇති දත්ත පිළිබඳ ආරවුල්)

යොමු කරන ලද දත්ත පිළිබඳ ආරවුල් වල සවිස්තරාත්මක තොරතුරු මෙහිදී දක්වන අතර, එහි සඳහන් කර ඇති Referenced Entity Code මගින් එම ආරවුල යොමු කර ඇත්තේ, ණය තොරතුරු වාර්තාවේ සඳහන් කුමන තොරතුරකට එරෙහිවද යන්න මෙමගින් හඳුනාගත හැක.

List of all Disputes

**Entity Code** D2

| | | | |
|---|---|---|---|
| **Dispute ID** | 6 | **Dispute Status** | Active |
| **Type of Dispute** | Subject Dispute | **Reason of Dispute** | Incorrect Address |
| **Dispute Created Date** | 16-Aug-2022 | **Last Update Date** | 16-Aug-2022 |
| **Registered in Court** | No | **Referenced Entity Code** | – |
| **Entity Internal ID (EIID)** | 2547889144 | | |

**Entity Code** D1

| | | | |
|---|---|---|---|
| **Dispute ID** | 5 | **Dispute Status** | Active |
| **Type of Dispute** | Contract Dispute | **Reason of Dispute** | Settled - Not Updated |
| **Dispute Created Date** | 16-Aug-2022 | **Last Update Date** | 16-Aug-2022 |
| **Registered in Court** | No | **Referenced Entity Code** | C22 |
| **Entity Internal ID (EIID)** | 625412678 | | |

## අගරු වූ චෙක්පත් (Dishonoured Cheques)

ජංගම ගිණුමෙහි ප්‍රමාණවත් පරිදි මුදල් නොමැතිවීම මත වාණිජ බැංකු මගින් කාර්යාංශය වෙත වාර්තා කරන ලද අගරු කරන ලද චෙක්පත් පිළිබඳ සාරාංශය මෙහිදි දක්වා ඇත.

### Dishonoured Cheques

| | | | |
|---|---|---|---|
| Dishonoured Cheques | ⚠ 10 Number of Dishonoured Cheques | 77 Weeks Since Last Dishonoured Cheque | LKR 688K Total Dishonoured Cheque Amount |

| | |
|---|---|
| Number of Dishonoured Cheques | - අගරු වී ඇති සමස්ථ චෙක්පත් සංඛ්‍යාව. |
| Weeks Since Last Dishonoured Cheque | - ආසන්නතම අගරු වූ චෙක්පතෙහි, අගරු වූ දින සිට ඇති සති ගණන. |
| Total Dishonoured Cheque Amount | - අගරු වී ඇති චෙක්පත්වල සමස්ථ මූල්‍ය වටිනාකම. |

## List of All Dishonoured Cheques (අගරු වූ සියළු චෙක්පත් පිළිබඳ විස්තර)

මෙම කොටස තුල අගරු චෙක්පත් පිළිබඳ විස්තර පහත තොරතුරු සමගින් දක්වා ඇත.

≡ List of All Dishonoured Cheques

| Entity Code | Dishonour Date | Cheque Number | Amount LKR | Dishonour Reason | Member | Branch |
|---|---|---|---|---|---|---|
| B8 | 28-Jun-2021 | 754542 | 104,000 | Insufficient Funds | COMMERCIAL BANK | MATARA |
| B9 | 17-May-2021 | 754549 | 137,687 | Insufficient Funds | COMMERCIAL BANK | MATARA |
| B7 | 11-May-2021 | 854537 | 60,842 | Insufficient Funds | NATIONAL BANK | AKURESSA |
| B10 | 11-May-2021 | 855555 | 40,252 | Insufficient Funds | NATIONAL BANK | AKURESSA |
| B5 | 15-Apr-2021 | 854521 | 41,640 | Insufficient Funds | NATIONAL BANK | AKURESSA |
| B6 | 15-Apr-2021 | 854522 | 100,000 | Insufficient Funds | NATIONAL BANK | AKURESSA |
| B1 | 15-Mar-2021 | 753158 | 81,200 | Insufficient Funds | COMMERCIAL BANK | MATARA |
| B2 | 15-Mar-2021 | 753170 | 44,700 | Insufficient Funds | COMMERCIAL BANK | MATARA |
| B3 | 15-Mar-2021 | 753192 | 31,550 | Insufficient Funds | COMMERCIAL BANK | MATARA |
| B4 | 15-Mar-2021 | 753195 | 45,850 | Insufficient Funds | COMMERCIAL BANK | MATARA |
| | | | **687,721** | | | |

**Entity Code** - වාර්තා කර ඇති අගරු චෙක්පත් හඳුනාගැනීමේ යොමු අංකය. එය ආරවුලක් ලියාපදිංචි කිරීමකදී ද භාවිතා වේ.

**Dishonour Date** - අගරු කළ දිනය.

**Cheque Number** - අගරු චෙක්පත් අංකය.

**Amount LKR** - අගරු චෙක්පතෙහි වටිනාකම.

**Dishonour Reason** - අගරු කිරීම සඳහා හේතුව. (ජංගම ගිණුමෙහි ප්‍රමාණවත් පරිදි මුදල් නොමැතිවීම)

**Member** - අගරු චෙක්පත් වාර්තා කළ වාණිජ බැංකුව.

**Branch** - අගරු චෙක්පත් වාර්තා කළ වාණිජ බැංකුවේ ශාඛාව.

වැදගත් : ණය තොරතුරු කාර්යාංශ පනතට අනුකූලව, ජංගම ගිණුමෙහි මුදල් නොමැති වීම මත අගරු වූ චෙක්පත් පිළිබඳ විස්තර, වාණිජ බැංකු මගින් එක්රැස් කිරීමටත්, එම අගරු චෙක්පත් පිළිබඳ විස්තර අගරු වූ දින සිට වසර 02 ක කාලයක් ණය තොරතුරු වාර්තාවල දැක්වීමත් සිදුවේ.

## උපයෝගිතා පහසුකම් (Utility Payments)

දුරකථන බිල්පත්, ජල බිල්පත්, විදුලි බිල්පත් වැනි පසු ගෙවුම් උපයෝගිතා සේවා සඳහා කරන ලද ගෙවීම් මෙමගින් විස්තර කෙරේ. මෙමගින් උපයෝගීතා සේවාවේ වර්ගයත්, එහි සක්‍රීය බව හෝ වසා ඇති බව, හිඟ දින ගණන සහ හිඟ මුදල, ලබාගෙන ඇති උපයෝගීතා සේවාවන් ගණන සහ එම සේවාවන් සපයන ආයතන ගණන යනාදී තොරතුරු මෙහිදී විස්තර කෙරේ.

### Utilities

| | | | | |
|---|---|---|---|---|
| Utilities | Number of Utility Accounts | 0 | Number of Different Providers | 0 |
| | Total Current Amount in Arrears | LKR 0 | Highest Current NDIA | 0 |
| | The Highest NDIA in 12 Months | 0 | | |

## රක්ෂණ පහසුකම් (Insurances)

ලබාගෙන ඇති රක්ෂණ පහසුකම් සඳහා කරන ලද ගෙවීම් මෙමගින් විස්තර කෙරේ. ලබාගෙන ඇති රක්ෂණ වර්ගය, එහි සක්‍රීය බව හෝ වසා ඇති බව, ලබාගෙන ඇති සේවාවන් ගණන සහ එම සේවාවන් සපයන ලද ආයතන ගණන, ලබාගෙන ඇති හිමිකම් ප්‍රමාණය යනාදී තොරතුරු මෙහිදී විස්තර කෙරේ.

රක්ෂණ කොටසෙහි පහත සඳහන් අංශයන් පිළිබඳ සවිස්තරාත්මක ව තොරතුරු දක්වා ඇත.

- Insurances Policies (රක්ෂණ පහසුකම්)
- Claims (හිමිකම්)

### Insurances

| | | | | |
|---|---|---|---|---|
| Insurances | Number of Insurance Policies | 0 | Number of Claims | 0 |
| | Total Current Amount in Arrears | LKR 0 | Highest Current NDIA | 0 |
| | The Highest NDIA in 12 Months | 0 | | |

## "පැහැදිලි කිරීම" (Explanations)

ණය තොරතුරු වාර්තාවේ අඩංගු සියළු කෙටි නාමයන් (කේතයන්) මේ යටතේ සවිස්තරාත්මකව දක්වා ඇත. එම කෙටි නාම වල පැහැදිලි කිරීම "List of All Credit Facilities" යටතේ ඉහත දක්වන ලදී.

| | | | | | |
|---|---|---|---|---|---|
| Explanations | **Delinquency status of Payment calendar** | **0-29 past due days** | **30-89 past due days** | **More than 90 past due days** | **No data available** |
| | **Other Abbreviations** | **NDIA** Number of Days in Arrears | **-** No data available | | |

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය
இலங்கை கொடுகடன் தகவல் பணியகம்
CREDIT INFORMATION BUREAU OF SRI LANKA
Tel: 011 2131313, Fax: 011 2338259
Email: info@crib.lk, Web Site: www.crib.lk